# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - BUCU E 2025

බෞද්ධ සමාජ චින්තාව - පුද සිරිත් හා උත්සව

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. ''මිනිසා පරිසරයටත් පරිසරය මිනිසාටත් බලපායි.'' සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. මිනිසාගේ ස්වාමිත්වය දරන දිව්‍යමය බලයක් ඇතැයි නොපිළිගන්නා බුදුදහම මානව ශක්‍යතාව කෙරෙහිම අවධානය යොමුකර ඇති අයුරු සකාරණව පැහැදිලි කරන්න.

03. සමාජානුයෝජනය යනු කුමක්දැයි හඳුන්වා දෙමින් එබඳු දිවි පැවැත්මකට පුද්ගලයා පොළඹවන බුද්ධානුශාසනා මොනවාදැයි පෙන්වා දෙන්න.

04. සැලසුම්ගත ලෙස ධනය පරිහරණය කිරීමට බුදුදහමින් කෙරෙන මග පෙන්වීම පුද්ගලයාගේ ආර්ථික ප්‍රගතියට ඉවහල් වන ආකාරය සනිදර්ශනව විමර්ශනය කරන්න.

05. ''ප්‍රජා සංවර්ධනය සඳහා නොයෙක් අයුරින් පියවර ගැනීම පාලකයාගේ වගකීමයි.'' රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

06. බුදුදහම අනුව මිනිසුන් වරදට පොළඹවන මූලික හේතු සාධක කවරේදැයි සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.

07. මිත්‍රත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පෙන්වාදෙමින් වත්මන් සමාජයටද සාපේක්ෂව එම ඉගැන්වීම්වල ප්‍රායෝගික වැදගත්කම ඇගයුමට ලක් කරන්න.

08. පිරිත යන්නෙහි අර්ථ විභාග කරමින් පරිත්ත සජ්ඣායනාවෙහි ඉතිහාසය පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් කරන්න.

09. ''පුද සිරිත් හා විශ්වාස තුළින්ම විමුක්තිය ලැබිය හැකි දැයි නූගන්වන නමුදු බුදුසමය ඒවා සපුරා බැහැර නොකරයි.'' විමසන්න.

10. ත්‍රිවිධ චෛත්‍යය පිළිබඳ සංකල්පය හඳුන්වාදෙමින් ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතිය තුළ එයට හිමිව ඇති සුවිශේෂී ස්ථානය පරීක්ෂා කරන්න.

************************************